# ජල සම්බන්ධතාවයක් ලබා ගැනිම සදහා වූ ගිවිසුම් පත්‍රය
# නොච්චියාගම ප්‍රාදේශිය සභාව

01. නොච්චියාගම ප්‍රාදේශිය සභා බල සීමාවට අයත් .......................................................................... ..................................................... ලිපිනයේ පදිංචි ............................................................. අංක දරණ ............................................................................................................................ යන අය (අයිතිකරු/පදිංචිකරු) එක් පාර්ශවයකින් ද නොච්චියාගම ප්‍රාදේශිය සභාවේ සභාපති/ලේකම් අනෙක් පාර්ශවයෙන් ද එකි දෙපස අතර පෞද්ගලික ජල සම්බන්ධතා සේවාවක් මගින් ජලය සැපයිම සදහා ඇතිකර ගන්නා ලද ගිවිසුමකි.

02. පහත සදහන් කාර්යයන් වෙනුවෙන් පහත ස්ථානයන්ට ජල සැපයුම් සදහා අවසර ලබන්නේ යයි සලකා, එනම් ආගමික / ගෘහ / රාජ්‍ය / වාණිජ පිණිස අත්සන් කරනු ලැබේ.

03.මෙහි පහත අත්සන් කරන ජල සැපයුම ලබා ගැනිමට අපේක්ෂිත ස්ථානයේ පදිංචිකරු/අයිතිකරු මෙහි ලා අඩංගු කොන්දේසි පිළිගැනිමට එකග වන්නේ ය.

3.1. ජලය සපයනු ලබන්නේ අගල් ½ පයිප්පයෙනි.

3.1. සභාවේ අතුරු ව්‍යවස්ථා මගින් හෝ සභා සම්මතයක් මගින් හෝ එවැනි ආකාරයකින් මින්පසු නියම කරනු ලබන ගාස්තු නියමිත කාලය තුළදි ගිවිසුම්කරු විසින් නොච්චියාගම ප්‍රාදේශිය සභාව වෙත ගෙවිය යුතු ය.

3.2. ජල සැපයුම් ලබා ගන්නා සෑම ඉල්ලුම්කරුවෙක් විසින් සභාව විසින් තිරණය කරනු ලබන මුදලක් තැන්පතු වශයෙන් තැන්පත් කළ යුතු ය.

3.3. මාසිකව ලබා ගත් ජල ඒකක ප්‍රමාණය වෙනුවෙන් සභාව විසින් නිකුත් කරන ජල බිල්පතට අදාල මුදල නියමිත කාලය තුළදි සභාව වෙත නොගෙවා සිටිමේ දි අදාල තැන්පත් මුදල ඉක්මවා යෑමේදි ජල සැපයුම විසන්ධි කරනු ලැබේ.

3.4 එසේ විසන්ධි කළ ජල සැපයුම නැවත ලබා ගැනිමට අපේක්ෂා කරන්නේනම් අදාල හිග මුදල හා දඩ මුදලත් (රු.2500.00) නැවත සන්ධි කිරිමේ ගාස්තුවත් (රු.2500.00) එක්ව මුළු මුදල (රු.5000.00) එකවර ගෙවිමට සිදු වේ.

3.5 ජල සම්බන්ධතාවය ලබා දිමට අදාල සභාව සතු දේපල අලාභහානියක් සිදු කළහොත් ඒ වෙනුවෙන් සභාව විසින් අය කරන සියළු ගාස්තු ප්‍රමාණයන් ගෙවිය යුතුය.

3.6. ජල සැපයුම ලබා දිමට අදාල සභාව සතු දේපල මැනවින් නඩත්තුව හා ආරක්ෂා කිරිම ගිවිසුම්කරු සිදුකළ යුතු ය.

3.7. අදාල ජල සැපයුම විසන්ධි කරවා ගැනිමට අපේක්ෂා කරන්නේනම් නියමිත දින සිට කාර්යාල දින 14 කට පෙර ඒ බව ලිඛිතව දන්වා සිටිය යුතු අතර ඒ වන විට අයවිය යුතු ජල ගාස්තු සම්පුර්ණයෙන්ම ගෙවා අවසන් කර තිබිය යුතු ය.

3.8. ජල සැපයුම අත්සතු කිරිමක් හෝ පවරා දිමක් සිදු නොකළ යුතු අතර එසේ වන අවස්ථාවක ඒ පිළිබදව සභාව විධිමත් පරිදි කටයුතු කළ යුතු ය.

3.9. ජල සම්පාදන කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථා පිළිපැදිමට එකග වන්නේ ය.

20......ක් වූ .................... මස ........ වන දින නොච්චියාගම ප්‍රාදේශිය සභාවේ දි අත්සන් තබන ලදි.

.................................
ගිවිසුම්කරුගේ අත්සන

දිනය :-

...................................
ලේකම්/සභාපති
ප්‍රාදේශිය සභාව
නොච්චියාගම
දිනය :-